# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**2094/27 – 2018 ඔක්තෝබර් 23 වැනි අඟහරුවාදා – 2018.10.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශ්‍යතාවය, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශ්‍යතාවය අත්කරගනු ලබන්නේ කවර ඉඩමකින් ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.–** මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ දිප්පිටිය සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළය සුළු කොට්ඨාසයේ, දිප්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/ඒකේආර්/2016/418 හා 2017.04.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ප්‍රමාණය: හෙක්. 0.0093ක් පමණ**

උතුරට: පාර, එස්. එම්. එස්. නුරුල් අස්මියා හිමිකම් කියන සයිස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට් සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: දිප්පිටිය අරඹේපොල මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ යූ. ජී. එන්. හීන් බණ්ඩා හිමිකම් කියන සයිස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට්; බටහිරට: යූ. ජී. එන්. හීන් බණ්ඩා හිමිකම් කියන සයිස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට්.

02. **කැබලි අක්ෂර 'බී' – සයිස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට් – ප්‍රමාණය: හෙක්. 0.0053**

උතුරට: එස්. එම්. එස්. නුරුල් අස්මියා හිමිකම් කියන සයිස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට් සහ එම්. පී. අතුල ප්‍රියදර්ශන බණ්ඩාර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: එම්. පී. අතුල ප්‍රියදර්ශන බණ්ඩාර හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: දිප්පිටිය අරඹේපොල මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2015/ඩබ්ලිව්එස්/133.
2018 අගෝස්තු මස 27 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 - 373

1A – G 28797 – 26 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*